# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන)

**1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

විදේශ අමාත්‍යතුමා විසින් 2022 පෙබරවාරි මස 10 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 ජනවාරි මස 27 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[106 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 18.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, රඳවා තබා ගැනීමේ නියමයක් යටතේ යම් තැනැත්තකු රඳවා තබා ගන්නා මුළු කාලසීමාව මාස දහඅටේ සිට මාස දොළහ දක්වා අඩු කිරීම සඳහා, (මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***3 වන වගන්තිය*** : සැකකරු, මෙම වගන්තිය මගින්, 1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනතේ විධිවිධාන සලස්වා ඇති ප්‍රමාණයට ආරක්‍ෂා සහිතව සිටින බව තහවුරු කරගැනීම සඳහා රැඳවුම් ස්ථානයට පැමිණීමට මහෙස්ත්‍රාත්වරයාට හැකියාව ලබා දීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියෙහි 9අ සහ 9ආ අලුත් වගන්ති ඇතුළත් කරනු ලැබේ.

***4 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 හෝ 140 වන ව්‍යවස්ථා යටතේ සහතික කරන ලද ප්‍රතිකර්මයක් සඳහා ඉල්ලීම් කිරීමට රැඳවුම්කරුවකුට හැකියාවක් ලබාදීම වේ.

***5 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, නීතිඥවරයකුට රිමාන්ඩ් භාරයේ හෝ රැඳවුම් භාරයේ සිටින තැනැත්තකු වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලබා දීමට සහ රිමාන්ඩ් භාරයේ හෝ රැඳවුම් භාරයේ සිටින තැනැත්තාට සිය ඥාතීන් සමඟ සන්නිවේදනය කිරීමට හැකියාව ලබා දීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියෙහි 10අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

***6 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ සැකකරු වධදීමට ලක්ව නොමැති බවට තහවුරු කිරීම සඳහා, එම ප්‍රඥප්තියේ 11 වන වගන්තිය යටතේ නියමයක් ලබා දීමට පෙර එම තැනැත්තා අධිකරණ වෛද්‍ය නිලධරයකු වෙත ඉදිරිපත් කිරීම සඳහා හැකියාව ලබා දීම වේ.

***7 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ඉවත් කරනු ලැබේ.

***8 වන වගන්තිය*** : මෙම වගන්තිය මඟින්, නඩුවේ කටයුතු අප්‍රමාදව හමාර කිරීම තහවුරු කිරීමට දිනපතා නඩු විභාග පැවැත්වීමට විධිවිධාන සැලැස්වීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***9 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 11 වන වගන්තිය මඟින් සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***10 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, සිර භාරයේ හෝ රැඳවුම් භාරයේ සිටිනු ලබන තැනැත්තන්ට ඇප ප්‍රදානය කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා, ප්‍රධාන ප්‍රඥප්තියේ 15ආ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

***11 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 7 වන වගන්තිය මඟින් සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***12 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් හෝ දෙයක් සඳහා නිලධරයන්ට සලසා ඇති ආරක්ෂාව නොතකා ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පනවන ලද නියෝගයක් හෝ ලබා දෙන ලද විධානයක් ප්‍රශ්න කිරීමට විධිවිධාන සැලැස්වීම වේ.

***13 වන වගන්තිය*** : "පුවත්පත" සහ "මුද්‍රණාලය" යන අර්ථ නිරූපණ ඉවත් කිරීම සඳහා "වධදීම" යන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීම සඳහා මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

**ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන)**

එල්.ඩී.—ඕ. 1/2022

**1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

**1.** මේ පනත 2022 අංක      දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 48 දරන පනතේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 9 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ අතුරු විධානයේ "මාස දහ අටක කාලයක්" යන වචන වෙනුවට "මාස දොළහක කාලයක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ සහ 9ආ වගන්ති ඇතුළත් කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 9අ සහ 9ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු යː-

"රඳවා තැබීමේ නියමයේ සහතික කළ පිටපතක් මහෙස්ත්‍රාත්වරයාට භාර දිය යුතු බව

9අ. (1) 9 වන වගන්තිය යටතේ කරන ලද නියමය අදාළ වන තැනැත්තා රඳවා තබා ඇති ස්ථානය පිහිටා ඇත්තේ කවර මහෙස්ත්‍රාත්වරයකුගේ අධිකරණ කොට්ඨාසයක් තුළ ද, එම මහෙස්ත්‍රාත්වරයා වෙත, ඒ නියමයේ සහතික කළ පිටපතක්, 9ආ වගන්තිය ප්‍රකාරව එම රඳවා තැබීමේ ස්ථානය බැලීමට යාම සඳහා සාධාරණ කාලසීමාවක් ඇතුළත ලැබීමට සැලැස්විය යුතු ය.

(2) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් බලය පවරන ලද තැනැත්තන් විසින් 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත ප්‍රකාරව රඳවා තැබීමේ ස්ථානය බැලීමට යාම සඳහා, 9 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු රඳවා තැබීම පිළිබඳව එකී පනතේ 28 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම්

කොමිෂන් සභාව වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

**රඳවා තැබීමේ ස්ථානය බැලීමට යාම මහෙස්ත්‍රාත්වරයාගේ කාර්යය බව**

9ආ. (1) (මේ වගන්තියේ මින්මතු “සැකකරු” යනුවෙන් සඳහන් කරනු ලබන) රඳවා තැබීමේ නියමය අදාළ වන සැකකරු, 1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනතේ විධිවිධාන සලස්වා ඇති ප්‍රමාණයට ආරක්ෂිතව සිටින බවට සහතික කර ගැනීම සඳහා, රඳවා තැබීමේ කාලසීමාව තුළ යටත් පිරිසෙයින් සෑම මසකට එක් වරක්වත් රඳවා තැබීමේ ස්ථානය බැලීමට යාම 9අ වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව රඳවා තැබීමේ නියමයක සහතික කරන ලද පිටපතක් ලැබී ඇති සෑම මහෙස්ත්‍රාත්වරයකුගේ ම කාර්යය වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, රඳවා තැබීමේ ස්ථානය බැලීමට යන මහෙස්ත්‍රාත්වරයා විසින්-

(අ) සැකකරු පුද්ගලිකව දැකබලා ගෙන එම සැකකරුගේ යහසාධනය, සුබසාධනය සහ එම සැකකරු එම රඳවා තැබීමේ ස්ථානයේ රඳවා තබාගෙන සිටින්නේ කවර තත්ත්වයන් යටතේ ද යන්න පිළිබඳ සොයා බැලීම;

(ආ) ඔහුගේ නිරීක්ෂණ සහ සැකකරු විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි යම් පැමිණිල්ලක් වාර්තාගත කිරීම,

කරනු ලැබිය යුතු ය.

(3) සැකකරු වධදීමට ලක් වී ඇති බව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන අවස්ථාවක දී, වෛද්‍ය පරීක්ෂණයක් සඳහා එම සැකකරු අධිකරණ වෛද්‍ය නිලධරයකු වෙත ඉදිරිපත් කරන ලෙස ද, එම වෛද්‍ය නිලධරයා විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත්

කරන ලෙස ද මහෙස්ත්‍රාත්වරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය.

(4) සැකකරු වධදීමට ලක් වී ඇති බවට එම වෛද්‍ය නිලධරයාගේ වාර්තාව මගින් හෙළිදරව් වන අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින් එම සැකකරුට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සඳහා උචිත ආඥාවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) වධදීම සිදුකර ඇතැයි චෝදනා ලැබ සිටින තැනැත්තාට එරෙහිව අපරාධ නීති කෘත්‍යයක් ආරම්භ කිරීම සඳහා නීතිපතිවරයාට හැකි වනු පිණිස, කරන ලදැයි කියනු ලබන වධදීම පිළිබඳව විමර්ශනයක් ආරම්භ කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් පොලිස්පතිවරයා වෙත විධාන කිරීම ද කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

“9 වන වගන්තිය යටතේ වූ නියමය අවසානාත්මක විය යුතු බව

10. 9 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් අවසානාත්මක විය යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව හෝ 140 වන ව්‍යවස්ථාව යටතේ වූ නීති කෘත්‍යයවල දී හැර කිසිදු නීති කෘත්‍යයක දී හෝ කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ වගන්තිය ඇතුළත් කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 10අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

“නීතිඥවරයකුට රිමාන්ඩ් භාරයේ හෝ රැඳවුම් භාරයේ සිටින තැනැත්තකු වෙත ප්‍රවේශ වීමට හැකියාව තිබිය යුතු බව

10අ. (1) මේ පනත යටතේ රිමාන්ඩ් භාරයේ හෝ රැඳවුම් භාරයේ තබන ලද තැනැත්තකු නියෝජනය කරන නීතිඥවරයකුට, මේ පනත යටතේ සාදන ලද නියෝගවලින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව හෝ වෙනත් ලිඛිත නීතියක විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ තැනැත්තා වෙත ප්‍රවේශවීමට සහ ඒ තැනැත්තා වෙනුවෙන් නියෝජනයන් සිදු කිරීමට අයිතිය තිබිය යුතු ය.

(2) මේ පනත යටතේ රිමාන්ඩ් භාරයේ හෝ රැඳවුම් භාරයේ තබා සිටින තැනැත්තකුට ලිඛිත නීතියේ විධිවිධාන සලස්වා ඇති පරිදි ඔහුගේ ඥාතීන් සමඟ සන්නිවේදනය කිරීම සඳහා අයිතිය තිබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

“(1අ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද, එම නියමය ඒ තැනැත්තාට භාර දීමට පෙර ඔහු වෛද්‍ය පරීක්ෂණයක් සඳහා අධිකරණ වෛද්‍ය නිලධරයකු වෙත ඉදිරිපත් කළ යුතු අතර, අධිකරණ වෛද්‍ය නිලධරයා විසින් ඒ තැනැත්තා සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දිය යුතු ය.

(1ආ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක්, එම නියමය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තා පදිංචිව සිටිනුයේ කවර මහෙස්ත්‍රාත්වරයකුගේ අධිකරණ කොට්ඨාසය තුළ ද, එම මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට භාරදිය යුතු අතර, ඒ තැනැත්තාට ඒ නියමය භාරදීමට පෙර ඒ තැනැත්තා වධදීමට ලක් වී නොමැති බව සහතික කිරීම සඳහා (1අ) උපවගන්තියේ දක්වා ඇති අධිකරණ වෛද්‍ය නිලධරයාගේ වාර්තාව, මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(1ඇ) (1අ) උපවගන්තිය යටතේ අධිකරණ වෛද්‍ය නිලධරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව මගින් ඒ තැනැත්තා වධදීමට ලක් වී ඇති බව හෙළිදරව් වන අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම සඳහා උචිත ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(1ඈ) වධදීම සිදුකර ඇතැයි චෝදනා ලැබ සිටින තැනැත්තාට එරෙහිව අපරාධ නීති කෘත්‍යයක් ආරම්භ කිරීම සඳහා නීතිපතිවරයාට හැකි වනු පිණිස, කරන ලදැයි කියන වධදීම පිළිබඳව විමර්ශනයක් ආරම්භ කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින්

පොලිස්පතිවරයා වෙත විධාන කිරීම ද සිදු කළ හැකි ය.”.

(2) එහි (3) වන උපවගන්තියේ අතුරු විධානයේ "මාස දහ අටක්" යන වචන වෙනුවට "මාස දොළහක්" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (5) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

“(5) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද නියමය අවසානාත්මක විය යුතු අතර, එම නියමය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව හෝ 140 වන ව්‍යවස්ථාව යටතේ වූ නීති කෘත්‍යයක දී හැර කිසිදු නීති කෘත්‍යයක දී හෝ කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.”.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ඉවත් කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙනන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම

"(3) අධිකරණයේ මතය අනුව වාර්තාගත කළ යුතු ව්‍යතිරේකීය අවස්ථාගත කරුණු මත නඩු විභාගය ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම කල්දැමීම යුක්ති සහගත වන්නේ නම් මිස, මේ පනත යටතේ වන සෑම නඩු විභාගයක් ම දිනපතා පැවැත්විය යුතු ය.".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ "19(අ) වගන්තියේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "19 වන වගන්තියේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ වන වගන්තිය සංශෝධනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 15ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු යः-

ප්‍රධාන ප්‍රඥප්තියේ 15ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

"රිමාන්ඩ් භාරයේ හෝ රැඳවුම්භාරයේ සිටින තැනැත්තන්ට ඇප ලබා දීම

15ආ. මේ පනතේ විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනත යටතේ රිමාන්ඩ් භාරයේ හෝ රැඳවුම් භාරයේ තබා ඇති තැනැත්තකු අත්අඩංගුවට ගනු ලබන දින සිට මාස දොළහක් ඉකුත්වීමෙන් පසුවත් එම තැනැත්තාට එරෙහිව වන නඩු විභාගය ආරම්භ කර නොමැති නම්, සැකකරු හෝ ඔහු වෙනුවෙන් නීතිඥවරයකු විසින් තත්කාර්ය සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීමකින් පසු අභියාචනාධිකරණය විසින් ඒ තැනැත්තා ඇප මත නිදහස් කරනු ලැබිය හැකි යඃ

එසේ වුවද, මේ වගන්තියේ කලින් වූ විධිවිධාන මගින්, 15 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ මහාධිකරණය විසින්, නඩු විභාගය අවසන් කරනු ලබන යම් තැනැත්තකු රිමාන්ඩ් භාරයේ තැබීමට ආඥාවක් කරනු ලැබීමෙන් වැළැක්වීමක් සිදු නොවිය යුතු යඃ

එසේ වුව ද, තවදුරටත්, අධිචෝදනා ඉදිරිපත් කොට මහාධිකරණයේ ගොනු කරනු ලැබ ඇත්තේ යම් චූදිතයකුට එරෙහිව ද, එම චූදිතයාට එරෙහිව නඩු විභාගයක් ඒ ගොනු කිරීමේ දින සිට මාස දොළහක් ඉකුත්වීමෙන් පසුවත් ආරම්භ කර නොමැති අවස්ථාවක දී, මහාධිකරණය විසින්, චූදිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් නීතීඥවරයකු විසින් තත්කාර්ය සඳහා කරන ලද ඉල්ලීමකින් පසුව ඒ තැනැත්තා ඇප මත නිදහස් කිරීමට සලකා බලනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේඃ-

"ඇප ලබාදීමට අදාළ යම් ලිඛිත නීතිවල විධිවිධාන මේ පනත යටතේ යම් වරදකට චෝදනා ලැබූ තැනැත්තන්ට අදාළ නොවිය යුතු බව

19. වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, මේ පනත යටතේ යම් වරදකට යම් අධිකරණයක් විසින් වරදකරු කරන ලද සෑම තැනැත්තකු ම ඔහු වරදකරුවකු කිරීමට එරෙහිව හෝ ඔහුට පනවන ලද දඬුවමට එරෙහිව අභියාචන පෙත්සමක් ඉදිරිපත් කර තිබුණ ද, අභියාචනය තීරණය කරනු ලබන තෙක් එම තැනැත්තා රිමාන්ඩ් භාරයේ තැබිය යුතු යඃ

එසේ වුව ද, අභියාචනාධිකරණය විසින් ව්‍යාතිරේඛීය අවස්ථාගත කරුණුවල දී, අභියාචනාධිකරණය සුදුසු යයි සලකනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව එවැනි යම් තැනැත්තකු ඇප මත නිදහස් කළ හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

“නිලධරයන් ආදීන්ට ආරක්ෂාව

26. (1) මේ පනත යටතේ කරන ලද යම් නියමයක් හෝ දෙන ලද යම් විධානයක් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව හෝ 140 වන ව්‍යවස්ථාව යටතේ නීති කෘත්‍යයක දී ප්‍රශ්න කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ කරන ලද යම් නියමයක් හෝ දෙන ලද යම් විධානයක් අනුව කරන ලද හෝ කරන ලදැයි සැලකෙන්නා වූ ද සද්භාවයෙන් කරන ලද හෝ සද්භාවයෙන් කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් යම් නිලධරයකුට හෝ තැනැත්තකුට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩුවක්, චෝදනාවක් හෝ නීති කෘත්‍යයක් ආරම්භ කිරීම නොකළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) “ප්‍රවෘත්ති පත්‍රය” යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්;

(2) “මුද්‍රණාලය” යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්;

(3) “නිශ්චිත තැනැත්තා” යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

“ “වධදීම” යන්නට, 1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනත යටතේ ඒ යෙදුමට දෙන ලද අර්ථය ම තිබිය යුතු ය.”.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව